// අති විශේෂ

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2312/47 - 2022 දෙසැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x)(ආ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1)(ආ) වගන්තිය සමග කියවිය යුතු 25අ වැනි වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1)(ආ) වන වගන්තිය සමග කියවිය යුතු 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක ජී.එල්. 24 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2022 ඔක්තෝබර් මස 19 වැනි දින අංක 2302/17 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II උපලේඛනයේ, පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

**කොන්දේසි**

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී ;

(අ) අවම අධ්‍යයන සම්භාර 60ක් සහිත (ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) දස වන මට්ටම) ජාල ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සම්බන්ධයෙන් -

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය ; හෝ

1A - PG 6130 — 286 (2022/12)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ii) ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය මගින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය ; හෝ

(iii) අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසරක පළපුරුද්දක් සහිත ඉහත (i) සහ (ii) හි නිශ්චිතව දක්වා ඇති සුදුසුකම්වලට සමාන ඕනෑම වෘත්තීය ඉංජිනේරු සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය. එම වෘත්තීය සුදුසුකම පිළිගැනීම මෙන්ම ක්ෂේත්‍රයේ අදාළත්වය අදාළ පීඨය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, අදාළ සෙනට් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) එකොළොස් වන මට්ටමෙහි නියම කරනු ලැබ ඇති ආකාරයෙන්, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශනපති උපාධිය සම්බන්ධයෙන් -

(i) පීඨය විසින් පිළිගනු ලබන සම්බන්ධිත ක්ෂේත්‍රයක පර්යේෂණ කුසලතා සාක්ෂි සමග 0 - 4.0ක පරිමාණයේ 3.7ක අවම GPA අගයක් සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් සහිතව සම්පූර්ණ කරන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) 6 වන මට්ටමෙහි ගෞරව උපාධියක් ලබා තිබීම ;

(ii) අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් සහිතව සම්පූර්ණ කරන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) 6 වන මට්ටමෙහි ගෞරව උපාධියක් ලබා තිබීම සහ සුදුසුකම් ලැබීමේ විභාගයක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම ;

(iii) අදාළ ක්ෂේත්‍රයේ 0-4.0 පරිමාණයේ 3.0ක අවම GPA අගයක් සහිතව ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) 5 වන මට්ටමෙහි උපාධියක් ලබා තිබීම සහ එම ක්ෂේත්‍රයේම, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) 6 වන මට්ටමට සමානවන ආකාරයේ අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කිරීමෙන් පසු පවත්වනු ලබන සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම ;

(iv) අදාළ ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) 7 වන මට්ටම හෝ ඊට වැඩි සුදුසුකමක් ලබා තිබීම ;

(v) 0 - 4.0ක පරිමාණයේ 3.0ක අවම GPA අගයක් සමග NVQ 7 වන මට්ටම සම්පූර්ණ කර තිබීම සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) 6 වන හෝ 7 වන මට්ටමට සමාන අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කිරීමෙන් පසු ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) ආයතනයේ අධ්‍යයන අධිකාරිය විසින් තීරණය කරනු ලබන පරිදි පවත්වනු ලබන සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සාර්ථකව සම්පූර්ණ කර තිබීම,

යන්නට අනුකූලව විය යුතු ය.

(ඇ) නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) ආයතනය පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ජාල ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්එස්සී (ජාල ඉංජිනේරු විද්‍යාව) |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශනපති උපාධිය | එම්ෆිල් (ව්‍යාපාර පරිපාලනය) |

ආචාර්ය ඒ. ඩී. **සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.